
# සමනළයා සහ

# මී මැස්සා



යුගානි යසස්මා විජේකෝන්



කෘතියේ නම :- සමනළයා සහ මී මැස්සා


කතෘගේ නම :- යුගානි යසස්මා විජේකෝන්

චිත්‍ර :- යුගානි යසස්මා විජේකෝන්

මුද්‍රිත දිනය :- 2023.11.25

ISBN අංකය :- 978-624-206-923-4

කතෘගේ වෙනත් කෘති :- අපේ සෙල්ලම් ගෙදර



# පිදුම




මා හට ශක්තියක් වූ

මගේ දෙමව්පියන්ටත් මෙම පොත ලිවීමට
මාව උනන්දු කරවපු

ආදරණීය සමන්මලී ගුරුතුමියටත්

මෙම පොත

සෙනෙහසින් පුදමි ...



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥා සම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබි සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහොදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදවු උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.


ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය,

මහාමායා බාලිකා විද්‍යාලය,

මහනුවර.


2023.11.01

එක දවසක් කැලයක ලස්සන  සමනළ පැටියෙක් හිටියා. දවසක් මේ සමනළ පැටියට ලොකු බඩගින්නක් ආවා. ඊට පස්සේ මෙයා හැමතැනම මල් පැණි හෙව්වා. හොයලා හොයලා මෙයාට දැන් ගොඩක් බඩගිනියි. දවස් ගානක් ගත වුණා.

දැන් නම් සමනළ පැටියට ගොඩක් බඩගිනියි. මෙන්න මෙහෙම මෙයා හැමතැනම මල් පැණි හොයනකොට මෙයාට ලොකු රෝස මලක් හම්බවුණා.





ඉතින් මෙයා මල් පැණි බොන්න හදනකොටම මෙයා දැක්කා මේ මල මී මැස්සෙක් ආරක්ෂා කරනවා.


ඉතිං මේ සමනළ පැටියා ගොඩක් බයවුණා. ඊට පස්සේ මී මැස්සා ඇහුවා ඇයි ඔයා මෙහෙට ආවෙ කියලා ?

“අනේ මී මැස්සෝ මට ගොඩක් බඩගිනියි.... මම දවස් ගානක් බඩගින්නේ, ඒක හින්දා මට පැණි ටිකක් දෙනවද?”

“ හා මම දෙන්නම්... ආ මෙන්න”.

“බොහෝම ස්තූතියි ……”

...





"අපි දෙන්නා යාලුවෝ වෙමුද?"

සමනළ පැටියා ඇහුවා.

" හා... අපි දෙන්නා යාලුවෝ වෙමු" මී මැස්සා කිව්වා.

දවස් ගොඩක් ගත වුණා දැන් මේ දෙන්නා හොදම යාලුවෝ.


දැන් මේ දෙන්නාම එකමුතු වෙලා මල් පැණි හොයාගෙන දෙන්නම බෙදාගෙන බිව්වා.

ඉතිං මේ දෙන්නා ඔහොම යාලුවෙලා පියඹාගෙන යනකොට කටුස්සෙක් දැක්කා.





ඊට පස්සේ මේ සමනළ පැටියා කටුස්සා ගැන දන්නැති නිසා කටුස්සා ළඟින්ම පියාඹගෙන ගියා.පියාඹබ කොටම සමනළ පැටියා කටුස්සාව අල්ලගන්න හැදුවා.





එත් මී මැස්සා හිටපු නිසා මී මැස්සා කෝටුවක් ගෙනැවිත් කටුස්සාගෙ කට ළඟින් තිබ්බා. ඊට පස්සේ සමනළ පැටියා බේරුණා.

ඊට පස්සේ මී මැස්සා සමනළ පැටියට කටුස්සා ගැන කියලා දුන්නා. සමනළ පැටියා තේරුම් ගත්තා කටුස්සා කියන්නේ භයානක සතෙක් බව.




. සමනල් පැටියා මී මැස්සාට ගොඩාක් ස්තූති කළා. ඉතින් මී මැස්සා කිව්වා ඔයා කවදාවත් ආපහු භයානක සතුන් ගාවට යන්න එපා එගොල්ලො හරි භයානකයි.

ඉතින් සමනල් පැටියා ආයකවදාවත් භයානක සතුන් ගාවට ගියේ නෑ.





දවසක් මී මැස්සා නිදාගත්තට පස්සේ සමනල් පැටියා එළියෙ පියඹන්න ගියා. ඔන්න ඔහොම පියාඹාගෙන යද්දි එකපාරටම අර කටුස්සා සමනල් පැටියාව අල්ලගත්තා. ඊට පස්සේ සමනල් පැටියා කෑගැහුවා.





ඒ සද්දේ මී මැස්සට ඇහුණා. මී මැස්සා සමනළ පැටියා ව හැමතැනම හෙව්වා.

හොයනකොට මී මැස්සා අර කටුස්සාව දැක්කා. ඊට පස්සේ මී මැස්සා කටුස්සාගෙන් “කොහෙද සමනළ පැටියා” කියලා ඇහුවා. කටුස්සා කිව්වා

“මම එයාව දැක්කේ නෑ” කියලා.





ඊට පස්සේ මී මැස්සට හිතුනා මේ කටුස්සා කියන්නේ බොරුවක් කියලා . ඊට පස්සේ මී මැස්සා හොඳ පාඩමක් උගන්වන්නම් කියලා කටුස්සා ට අනින්න පටන් ගත්තා.





ඊට පස්සේ කටුස්සාගෙ කටින් සමනල් පැටියා ව විසි වුණා.



ඊට පස්සේ මී මැස්සා සමනල් පැටියා ව එතනින් ඉක්මනට අරන් ගියා. ඉතිං මී මැස්සා සමනල පැටියා ට ආයෙමත් කවදාවත් භයානක සතුන් ගාවින් යන්න එපා කියලා කිව්වා.

“ හා මම එහෙම කරන්නම්...” සමනල් පැටියා කිව්වා.

ඔන්න එක දවසක් කටුස්සා හොඳ උපායක් කල්පනා කළා. එයා අර සමනල් පැටියා එනකල්ම බලාගෙන හිටියා. ඊට පස්සේ සමනළ පැටියා මී මැස්සට කිව්වා අනේ මට මෙහෙම ඉඳලා කම්මැලියි. ඒක නිසා මට ටිකක් එළියට යන්න ඕන කියලා. ඊට පස්සේ මී මැස්සා කිව්වා “හා ඔයාට යන්න පුළුවන්... හැබැයි ගොඩක් පරිස්සම් වෙන්න. මොකද අර කටුස්සා ඔයාව අල්ලගන්න පුළුවන්”. මී මැස්සා කිව්වා.

“හා මම පරිස්සමින් යන්නම්” කිව්වා.

සමනළයා ඔහොම යද්දි අර කටුස්සව හම්බ උනා.



ඊට පස්සේ සමනළ පැටියා හයියෙන් පියාඹන්න ගත්තා. ඒත් අර කටුස්සා සමනළ පැටියා ව අල්ලගෙන කිව්වා“. මට බය වෙන්න එපා මම ඔයාට කරදර කරන්නේ නෑ”.

එහෙනම් කමක් නෑ කියලා සමනළ පැටියා කටුස්සාත් එක ගියා. ඊට පස්සේ සමනළ පැටියා ව කැලෑවකට එක්ක ගියා.



ඊට පස්සේ කටුස්සා සමනළ පැටියා ව අරන් ගිහිල්ලා ගිලින්න හදනකොටම එතනට අර මී මැස්සා ආවා. ඇවිල්ලා කටුස්සට හොඳටම ඇන්නා.


ඇනලා සමනළ පැටියා ව බේරගත්තා. සමනළ පැටියා මී මැස්සට ගොඩක් ස්තුති කළා.



ඊළඟ දවසේ මී මැස්සයි සමනළ පැටියයි පියාඹගෙන යනකොට තව සමනළයෝ දෙන්නෙක් හමුවුණා.

ඊට පස්සේ සමනළ පැටියා කිව්වා


“මට මේගොල්ලොන්ට දැකලා පුරුදුයි” කියලා. බලනකොට ඒ ඉන්නේ සමනළ පැටියගෙ අම්මයි තාත්තයි.






සමනළ පැටියා ගොඩාක් සතුටින් අම්මයි තාත්තයි ළඟට ගියා. සමනළ පැටියාගේ අම්මයි තාත්තයි ගොඩක් සතුටු වුණා. සමනළ පැටියා මී මැස්සා ගැන අම්මාටයි තාත්තටයි කිව්වා. සමනළ පැටියාගේ අම්මයි තාත්තයි මී මැස්සට ගොඩක් ස්තූති කළා.

ඊට පස්සේ සමනළ පැටියයි එයාගෙ අම්මයි තාත්තයි ගොඩක් සතුටින් ජීවත් වුණා.







# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට ඒකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොට ගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැන්වීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2024 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ත ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘත් රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විස්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම්, නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම පුදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුත් පාර්ශවයන්ට ආලොකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්,
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01

ISBN - 978-624-206-923-4

9 786242 069234